රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 360

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1986 දෙසැම්බර් මස 22 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියට
යටත්කොට විශ්‍රාම ගැන්වීම

1984.02.20 දිනැති අංක 239 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

1. 02(අ)iv ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

නිදහසට ඉදිරිපත් කර ඇති කරුණු අසතුටුදායක යයි ඔහු පිළිගන්නේ නම්, විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කටයුතු නොකළ යුතු අතර, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා, විශ්‍රාම ගැන්වීමේ ලිපි ලේඛණ සමඟ පහත සඳහන් කරුණු ද ඇතුලත් වාර්තාවක් විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ වෙත යැවිය යුතුය.

(අ) නිදහසට කරුණු කැඳවීමට තුඩුදුන් චෝදනා හෝ කරුණු

(ආ) නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු; සහ

(ඇ) නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් විනය බලධරයාගේ නිරීක්ෂණ.

2. 02(අ)vi ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

නියම කරන ලද කාලය ඇතුළත නිදහසට කරුණු ඉදිරිපත් කර නොමැත්තේ නම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා, ඉහත (v)හි දැක්වෙන පරිදි ක්‍රියාකිරීම සඳහා, චෝදනා හෝ නිදහසට කරුණු කැඳවීමට තුඩුදුන්කරුණු විශ්‍රාම වැටුප් ලිපිලේඛණ සමඟ විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ වෙත යැවිය යුතුය.

3. 02(ආ) II ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

දෙපාර්තමේන්තු ප්‍රධානියා විශ්‍රාම වැටුප් ලිපිලේඛණ සමඟ පහත සඳහන් දේ විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) චෝදනා පත්‍රය.

(ආ) පරීක්‍ෂණයේ නිගමන.

(ඇ) නිගමන සම්බන්ධයෙන් නිලධරයා නිදහසට යම්කිසි කරුණක් ඉදිරිපත් කර තිබෙන්නේ නම් එය.

(ඈ) ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු සතුටුදායක ද නැතහොත් අසතුටුදායක ද යන බවට විනය බලධරයාගේ නිරීක්‍ෂණ.

4. 02(ආ) III ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

නිදහසට කරුණු ඉදිරිපත් කර නොමැති නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා, විශ්‍රාම වැටුප් ලිපිලේඛණ සමඟ චෝදනා පත්‍රය සහ පරීක්‍ෂණයේ නිගමන විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.